

# තාක්ෂණික දියුණුව හා මානව සම්බන්ධතා



සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න




"අප දකින සියලු දේ, අප නොදකින දේවල සෙවණැල්ලකි." මේ අගනා කියමන, ආචාර්ය මාටින් ලූතර් කිංග් (කනිෂ්ඨ) නමැති ශ්‍රේෂ්ඨ පුද්ගලයා විසින් පළ කරන ලද්දකි. මෙම ප්‍රකාශය එක් වරටම අපට පැහැදිලි අවබෝධයක් ලබා නොදෙනු ඇත. එමෙන්ම මේ කියමන මගින් විවිධ අරුත් හෙළි කර ගත හැකි ද වෙයි. අපට නොපෙනෙන බොහෝ දේ මේ විශ්වය තුළ තිබෙන බව අමුතුවෙන් කිව යුතු නොවේ. විද්‍යාත්මක දියුණුවෙහි ප්‍රතිඵල ලෙස අභ්‍යවකාශයේ පිහිටි බොහෝ අරුම පුදුම දේ සාමාන්‍ය මිනිසාගේ දැනුමට එක් වී ඇත. ඈත අතීතයේ පටන්ම අදෘශ්‍යමාන බලවේගයන්ට දේවත්වාරෝපණයක් සිදු කිරීමට හා ඒවාට වන්දනාමාන කිරීමට පැරැන්නෝ යොමු වූහ. යක්ෂ, ප්‍රේත, භූත ආදී සංකල්ප එකල මිනිසාගේ අර්ථකථනයට ලක් වූයේ භීතියක් ද සමගය. එසේ වුවද, විවිධ වර්ගයේ බැක්ටීරියා පිළිබඳව නූතන විද්‍යාඥයන් කරන පර්යේෂණවලදී වඩා යථාර්ථවාදී ලෙස සිතා බැලීමට අද ජන සමාජය යොමු වී ඇත. මාටින් ලූතර් කිංග් පවසන, නොදකින දේවල සෙවණැල්ල වැටුණ අප දකිනා දේ වර්තමාන සමාජය තුළ විද්‍යාත්මක සත්‍යයන් හෙළි කරවනසුලු බව ද අවබෝධ කරගත හැකිය.

විද්‍යාව හා නූතන තාක්ෂණය මිනිස් සමාජයට පුළුල් ඥානයක් හා අවබෝධයක් ලබා දෙන්නා සේම මානව වර්ගයා එක් කර තැබීමේ ශක්‍යතාව ද ඊට ඇති බව පැහැදිලි කරුණකි. තාක්ෂණික දියුණුව හේතු කොට ගෙන මුළු ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත් කර ඇත යන මතය මෑත කාලය තුළ සමාජයේ දැඩි අවධානයට ලක් වී තිබෙන්නකි. විවිධ රටවල් හා එහි වෙසෙන ජාතීන් සතු සංස්කෘතික හා අනිකුත් අංශවල අනන්‍යතා මතු වී පෙනෙන විට එලෙසට සියල්ලන්ම එකම තලයකට ගත හැකිද යන ප්‍රශ්නය ද සාකච්ඡාවට භාජන වෙමින් පවතී. කෙසේ නමුදු නූතන තාක්ෂණය මගින් විශ්ව සමාජය එකට එක් කොට බැඳ තබන බවට නම් සැකයක් නැත. විවිධ සන්නිවේදන මාධ්‍යයන් මගින් රටින් රට ජනතාව එක් ක්ෂණයකින් සම්බන්ධ කරවන අන්දමේ දියුණු තාක්ෂණයක් විශ්ව සමාජය අද අත්පත් කරගෙන ඇත. මේ පිළිබඳව සිතන විට කා තුළ වුවද සතුටක් ඇතිවීම පුදුමයක් නොවේ.

කරුණු මෙසේ වුවද, එලෙසින් එකමුතු කර තබන මිනිස් වර්ගයා සමාජ ලෙසින්ම නොව තනි පුද්ගලයන් ලෙසින් හුදෙකලා කොට වෙන් කර තැබීමේ ප්‍රවණතාව ද නූතන තාක්ෂණික ප්‍රගමනය තුළ දක්නට ඇත. පසුගිය දා පුවත්පතක පළවූ කාටූනයක් මෙහිදී මගේ සිහියට නැගෙයි. ඉංග්‍රීසි පුවත්පතක වූ එහි එකී කාටූනය තුළ විද්‍යාමාන චරිත දෙකක් හා අවිද්‍යාමාන චරිතයක් ද වෙයි. 'ඇන්ඩි' නමින් තම පුත්‍රයා අමතන වැඩිහිටි පියා සහ ඔහුට පිටුපසින් සිටගෙන සිටින මවක් ද එහි දර්ශනය වෙති. තම පරිගණකය ඉදිරියේ ඉඳගෙන සිටින පියා, සිය බිරිඳ ද අවධානයෙන් දෑස් යොමු කරගෙන සිටියදී තම පුත්‍රයාට ඊමේල් පණිවුඩයක් යවමින් සිටියි. " ආදරණීය ඇන්ඩි, කොහොමද සුවදුක්? අම්මයි මමයි සනීපෙන්. ඔයා නැතිව අපට හරි දුකයි. කරුණාකර පරිගණක යන්ත්‍රයේ කටයුතු නවතා කෑමට පහත මාලයට එන්න. මේ ආදරණීය තාත්තා."

**මිනිසා හුදෙකලා සත්වයෙක් නොවේය යන්න පිළිගත් සත්‍යයකි. පවුල තුළ අන්‍යොන්‍ය සම්බන්ධතා, ආදරය, සෙනෙහස තිබීම සාර්ථක හා ප්‍රීතිමත් ජීවිතයකට අත්‍යවශ්‍යය.**

මෙම කාටූනය පළ කර ඇත්තේ කුඩා දරුවන් සඳහා බව ද එහි සටහන් වී ඇත. මෙම කාටූනයේ නිර්මාණ කරුවා ඉහත දැක්වෙන කෙටි සටහන මගින් අතිශය පුළුල් අරුත් සම්භාරයක් පළ කරයි. එකම නිවසේ වාසය කරන දෙමාපිය දෙදෙනාට පෙනෙන තෙක් මානයක නොසිටින තම පුත්‍රයා කෑම මේසයට කැඳවා ගත යුත්තේ ද 'ඊ මේල්' යැවීමෙනි. එක්තරා දුරකට අතිශයෝක්තියකින් වුව මෙම පණිවුඩය වර්තමාන සමාජයේ ජීවත් වන බොහෝ දෙනාට නූතන තාක්ෂණික දියුණුව මගින් පුද්ගලයන් ඈත් කර තබන්නට යොමු වී ඇති ආකාරය පෙන්වයි.

අතීතයේ ශ්‍රී ලංකාව තු-ළ, විශේෂයෙන් ගැමි සමාජ වටපිටාවක ජීවත් වූ ජනයා එක් ප්‍රදේශයක, එකම කොට්ඨාසයක් ලෙස දිවි ගෙවීම සාමාන්‍ය තත්වය වීය. ඥාති පවුල්වලින් සමන්විත එක් භූමි භාගයක, ඒ අසලම විසූ සෙසු අය ද සමීප සම්බන්ධතාවකින් යුතුව ජීවත් වූහ. තමන්ගේ කුඹුරු යායේ අස්වනු නෙළද්දී සහායට එන සෙසු අය වෙනුවෙන් ද තමා එවැනිම සේ-වයක් ඉටු කිරීම අමුතුවෙන් කරනු ලබන ඉල්ලීමකින් තොරව සිදු කෙරිණ. එක් නිවසක වහල සෙවිලි කරනු ලබන අවස්ථාවකදී ඒ සඳහා සහායට සෙසු ගම්වාසීන් කැඳවාගනු ලැබුවේ හූවක් මගිනි. මෙම කාර්යය ද අන්‍යොන්‍ය වශයෙන් දෙනු ලබන සහාය සමග සුහදව මෙන්ම කාර්යක්ෂම ලෙස ද සිදු විය. එක් නිවසක කෙරෙන යාග හෝම, තොවිල් පවිල් බඳු කටයුත්තකදී අවශ්‍ය කෙරෙන විවිධ දේ සපයා ගෙන ඒමට අසල්වැසි හැම දෙනාම පෙරැත්තයකින් තොරව සම්බන්ධ වීම ද සිදු විය. අසල්වාසී කවර හෝ කෙනකුගේ නිවසක තැනැත්තකු රෝගී වීම හෝ මිය යාම බඳු අවස්ථාවකදී වුව විශේෂ ඉල්ලීමකින් තොරව සැමගේ සහාය නොඅඩුව ලැබිණ. විවාහ මංගල උත්සවවලදී දින හතක් තිස්සේ ඥාති මිත්‍රාදීන් හා අසල්වැසියන් කැඳවා සංග්‍රහ කිරීම ද සැබවින්ම සිදු වූ තත්වයන්ය. අතිශය ජනාකීර්ණ නාගරික පරිසරයක මෙන් නොව, ගැමියන්ගේ වචනවලින්ම කිවහොත්, 'හූවක දුරක' වෙසෙන කවර හෝ පවුලක අය එකිනෙකාගේ දුක සැප බෙදාහදා ගනිමින්, එකිනෙකාට උපකාර කරමින්, එකමුතුව ජීවත් වූ අතීත සමාජ පරිසරය තු-ළ තාක්ෂණික මෙවලම් හෝ තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵල ලෙස ක්‍රියාත්මක වූ වෙනත් දේ හෝ නොවීය. එසේ වූ හෙයින්ම ඔවුනොවුන් අතර පැවති සුහදතාව, සංහිඳියාව අතිශය ප්‍රබල විය.

එදා පැවති මේ තත්වය සමග සසඳන විට වර්තමාන සමාජය තුළ පවත්නේ ඊට වඩා බහුල වශයෙන් වෙනස් ස්වභාවයක් බව කිව හැකිය. එක් අතකින් බලන විට විද්‍යාව හා තාක්ෂණය දියුණු වීමත් සමග මෙලෙස තනිව පැවති ජන කොට්ඨාසවලින් ද ඔබ්බට ගිය සාමූහිකත්වයකට ඉඩ ලැබුණද එහි අනික් අන්තය වී ඇත්තේ එකිනෙකා වෙන් කොට හුදෙකලා කරවන අන්දමේ තාක්ෂණික ප්‍රගමනයකි. පරිගණකය ප්‍රචලිත වීමත් සමග 'ෆේස් බුක්' වැනි වෙබ් අඩවි මගින් පුද්ගලයන් සමීප කරවීමක් අද සිදු වී ඇති බව සත්‍යයකි. කලක් තිස්සේ තොරතුරු නොදැන සිටි හිත මිත-ුරන් හෝ වෙනත් සමීප පුද්ගලයන් පිළිබඳ අලුත්ම තොරතුරු 'ෆේස් බුක්' මගින් දැනගැන්නට ලැබීමෙන් දුරස් වී සිටියවුන් එක්රැස් කිරීමට තාක්ෂණික මෙවලම් උපකාරී වී ඇති ආකාරය දැක්විය හැකිය.

එසේ වුවද මෙවන් වෙබ් අඩවි අයථා ලෙස පරිහරණය කරමින් පුද්ගලයන්ට වදහිංසා පැමිණවීම, ඔවුන් විවිධ අනතුරුවලට භාජන කරවීම වැනි අමිහිරි සිදුවීම් ද අනන්ත අප්‍රමාණව අද සිදු වන බව කිව යුතුය. එවන් අයහපත් තත්වයන් හැරුණ විට පරිගණක තාක්ෂණයේ විවිධ දියුණු අවස්ථා මගින් මිනිස් සමාජය එකමුතු කරවීමක් හා සමීප කරවීමක් ද බොහෝ දුරට සිදු වන බවට සැකයක් නැත. කරුණු එසේ වුවද, 'වඳුරාට දැළි පිහිය දුන්නා වාගේ' යන ප්‍රකට කියමන අනුව සිතන විට පරිගණක තාක්ෂණය වැරදි ලෙස භාවිත කරන්නට යොමු වීමෙන් ඇතැම් පුද්ගලයන් සමාජය එකමුතු කරනවා වෙනුවට සමා-ජයට වින කරන්නට පෙලඹී ඇති අවස්ථා ද එමටය.

පරිගණකය වූ කලී තම දැනුම වර්ධනය කරගැනීම, ආස්වාදය ලබාගැනීම, සමීප සම්බන්ධතා ඇති කරගැනීම වැනි අනේකවිධ අවශ්‍යතාවන් ඉටු කර දෙන විස්මිත තාක්ෂණික මෙවලමකි. මොහොතකින් ලෝකයේ කවර දෙයකට හෝ පිවිස තොරතුරු ලබා ගැනීමට පරිගණකය ඉමහත් ලෙස උපකාරී වෙයි. බාල වැඩිහිටි කවර අයගේ වුව දැනුම පුළුල් කර ගැනීමට ද පරිගණකය යහපත් මිතුරකු බව කිව හැකිය. පාළුව, කාන්සිය මකා ගනිමින් සුහද කතාබහට යොමු වීමට ද පරිගණකයෙන් ලැබෙන පිටිවහල ඉමහත්ය. ජීවිතයට අවශ්‍ය වන සතුට, විනෝදය ලබා ගැනීම සඳහා ද, විශේෂයෙන්ම කු-ඩා දරුවන් ප්‍රිය කරන අන්දමේ වීඩියෝ ක්‍රීඩා ආදියෙහි නියැලීමට ද මෙය අතිශයින් දායක වෙයි. විදේශීය රටවල ඇතැම් විට දරුවන් අතින් අකුරු ලිවීම, චිත්‍ර ඇඳීම බඳු ක්‍රියාකාරකම්වල නිරත වීමට ද පරිගණකය යොදා ගැනීමට යොමු වන බව සත්‍යයකි. එසේ නම් නූතන තාක්ෂණයේ ඉහළ තලයක පවතින පරිගණකය මෙන්ම අද ඒ සමානව වැදගත් වන ජංගම දුරකථන ද මිනිස් සබඳතා තර කරලීමට ඉවහල් වන තාක්ෂණික මෙවලම් ලෙස හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාව වැනි රටක දැනට දශක කීපයකට පෙර පැවති තත්වය වූයේ නිවසකට දුරකථන පහසුකම් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර වසර ගණනක් බලා සිටින්නට සිදුවීමය. ජංගම දුරකථන හඳුන්වා දෙනු ලැබීමත් සමග මේ තත්වයේ ශීඝ්‍ර වෙනසක් සිදු විය. පළමුව ඉල්ලීම් කොට දුරකථන පහසුකම් ලබා ගන්නට බලා නොසිටම වෙළඳපළට ගොස් ජංගම දුරකථනයක් මිල දී ගෙන ඊට අවශ්‍ය සිම් කාඩ්පතක් ද මුදල් ගෙවා ලබාගෙන හිතු මනාපයට එය භාවිත කරමින් කවර හෝ අස්සක් මුල්ලක් නෑර ඕනෑම කෙනකු-ට වාචිකව සම්බන්ධ වීමේ ඉඩකඩ අද පෑදී ඇත. ශ්‍රී ලංකාව වැනි රටක පවා වර්තමානයේ එක් පුද්ගලයකු සතුව එක් ජංගම දුරකථනයකට වඩා වැඩි සංඛ්‍යාවක් තිබීම ද අරුමයක් නොවේ. එදා ශ්‍රී ලාංකික ගැමි සමාජය තුළ පාසල් ශිෂ්‍යශිෂ්‍යාවන් භාවිත කළ ගල් කූර සහ ගල් ලෑල්ල කලක් යන විට අභ්‍යාස පොත සහ පැන්සලට මාරු විය. වැඩි කලක් නොයාම පොත හා පෑන පාසල් දරුවන් අත රැඳුණ අත්‍යවශ්‍ය අංග බවට පත් විය. මේ වන විට පාසල් දරුවන් සතුව ද ජංගම